සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**තෙවන වාර පරීක්ෂණය**
மூன்றாம் தவணைப் பரீட்சை - **2026**
**Third Term Test**

| ශ්‍රේණිය / தரம் / Grade | 12 | විෂයය / பாடம் / Subject | ඉන්දීය ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

**අමතර කියවීමේ කාලය මිනිත්තු 10 කි.**
අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
* **I** කොටසෙහි **1-40** දක්වා ප්‍රශ්න සියල්ලට ම **මෙම පත්‍රයේ ම** ලබා දී ඇති උපදෙස් පරිදි පිළිතුරු සපයන්න.
* **I** කොටසෙහි නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

* අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්න සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක්දැ' යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1) 1. හින්දුකුෂ් 2. සුලෙයිමාන් 3. කිර්තාර් 4. නිල්ගිරි 5. ආරවල්ලි (........)

2) 1. සත්ලේජ් 2. බීයස් 3. රාවී 4. චේනාබ් 5. යමුනා (........)

3) 1. ජෝන් මාර්ෂල් 2. R.D. බැනර්ජී 3. වසන්ත් සින්දේ 4. ස්ටුවර්ට් පිගොට් 5. A.L. බෂාම් (........)

4) 1. මස්කි 2. ගිර්නාර් 3. රුම්න්දෙයි 4. නාසික් 5. ධෞලි (........)

5) 1. වත්ස 2. ශාක්‍ය 3. මල්ල 4. ලිච්ඡවී 5. කෝලිය (........)

6) 1. ලෝතාල් 2. ඉන්ද්‍රපස්ථ 3. රූපාර් 4. චන්හුදාරෝ 5. කලිබංගන් (........)

7) 1. පාහියන් 2. තාරානාථ 3. හියුත්සාං
4. ඉත්සින් 5. සංයුං (........)

8) 1. පුෂ්‍යමිත්‍ර 2. සිසුනාග 3. නන්ද
4. මෞර්‍ය්‍ය 5. හර්යංක (........)

9) 1. ජම්බුද්වීප 2. ඉන්දොස් 3. සින්දොස්
4. භාරතදේශ 5. පලෙසි මුණ්ඩු (........)

10) 1. චන්ද්‍රගුප්ත 2. කාලාශෝක 3. බින්දුසාර
4. අශෝක 5. බෘහද්රථ (........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල** පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11) 1. රාජතරංගනී - වංසකතා
2. මහාභාරතය - වීරකාව්‍ය
3. යජුර්වේදය - වෛදික සාහිත්‍යය
4. අර්ථ ශාස්ත්‍රය - ව්‍යාකරණ ග්‍රන්ථ
5. රත්නාවලී - කාව්‍ය ග්‍රන්ථ (..........)

12) 1. ඉන්ද්‍ර - ජලයට අධිපති
2. වරුණ - අහසට අධිපති
3. අග්නි - ගින්නට අධිපති
4. සූර්‍ය්‍ය - දවසට අධිපති (..........)
5. යම - මරණයට අධිපති

13) 1. ග්‍රමිනී - ගමක පාලනය
2. සෝම - පානයකි
3. සභා - සියළුම ගෝත්‍රිකයන්ගෙන් නියෝජනය වූ මණ්ඩලයකි
4. නිෂ්ක - මුදල් ඒකකයකි. (..........)
5. සේනාපති - සේනාවේ ප්‍රධානියා

14) 1. අල්බිරූනී - අරාබි
2. තාරානාථ - ටිබෙට්
3. හෙරඩෝටස් - රෝම
4. ජස්ටීන් - ග්‍රීක (..........)
5. ඉත්සින් - චීන

15) 1. ආරවල්ලි - කඳුවැටි
2. ගුමාල් - දුර්ග
3. තාම්‍රලිප්ති - වරායන්
4. හේරාත් - ගංගා
5. රාජපුතානා - කාන්තාර (..........)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවලට දී ඇත. **Y** තීරයේ දී ඇති නාම/ ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් අකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙළට **නොවේ. Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16)

| X | Y |
|---|---|
| 1. ඉන්ඩිකා | A. ව්‍යාස |
| 2. අර්ථශාස්ත්‍ර | B. වාල්මිකී |
| 3. මහාභාරතය | C. කල්හාන |
| 4. රාමායනය | D. මෙගස්තනීස් |
| 5. රාජතරංගනී | E. කෞටිල්‍ය |

I. EDABC II. DEABC III. ABDEC IV. CDAEB V. BAECD (.......)

17)

| X | Y |
|---|---|
| 1. බිම්බිසාර | A. සිසුනාග |
| 2. කාලාශෝක | B. හර්යංක |
| 3. මහාපද්ම නන්ද | C. මෞර්ය |
| 4. බින්දුසාර | D. ශුංග |
| 5. පුෂ්‍යමිත්‍ර | E. නන්ද |

I. BADEC II. EBACD III. CBAED IV. ABEDC V. BAEDC (.......)

18)

| X | Y |
|---|---|
| 1. ඛාරවේල | A. අලහබාද් |
| 2. අශෝක | B. හතිගුම්ඵා |
| 3. සමුද්‍රගුප්ත | C. අයිහෝල් |
| 4. දෙවන චන්ද්‍රගුප්ත | D. ධෞලි |
| 5. දෙවන පුලකේෂීන් | E. මෙහෙරවුලි |

I. DBAEC II. BDEAC III. BDAEC IV. EABDC V. DBEAC (.......)

19)

| X | Y |
|---|---|
| 1. මරණයේ මිටියාවත | A. හින්දුකුෂ් කඳු පෙළ |
| 2. ඉන්දියාවේ ප්‍රවේශ දොරටුව | B. රායිචූර් |
| 3. ඉන්දියාවේ උතුරු සීමාව | C. ඛයිබර් |
| 4. වයඹ දිග ආරක්ෂකයා | D. මක්‍රන් |
| 5. ක්‍රිෂ්ණතුංග හද්‍රා දෙගංමැදිය | E. හිමාලයානු කඳු |

I. DCEAB II. DCAEB III. CDEAB IV. CDAEB V. ADCEB (.......)

20)
1. ගංගා — A. රූපාර්
2. සින්දු — B. පාඨලීපුත්‍ර
3. යමුණා — C. මොහෙන්ජොදාරෝ
4. රාවී — D. ඉන්ද්‍රපස්ත
5. සත්ලේජ් — E. හරප්පා

I. CBDEA  II. CBEAD  III. CBAED  IV. BCDEA  V. BCEAD (.......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21) වෛදික සාහිත්‍යය
1. වේදය යන පදයේ අර්ථය දැනුම යන්නයි.
2. වේද ග්‍රන්ථ හතරකි.
3. ඍග් වේදය මින් පළමු වේද ග්‍රන්ථය වේ.
4. වෛදික සාහිත්‍යට අයත් වන්නේ වේද ග්‍රන්ථ හතර පමණි.
5. වේද ග්‍රන්ථ මඟින් ආර්යයන්ගේ දේශපාලන, ආර්ථික, ආගමික තොරතුරු ලබා ගත හැක. (.......)

22) අශෝක සෙල්ලිපි
1. මෞර්ය යුගය අධ්‍යයනයට ඇති ප්‍රධාන පුරාවිද්‍යා මූලාශ්‍රයකි.
2. ගිරි ලිපි, ටැම් ලිපි, ලෙන් ලිපි ලෙස කොටස් තුනකි.
3. අශෝක ධර්මය පිළිබඳ තොරතුරු ඇතුළත්ය.
4. කාලිංගය ජය ගැනීම පිළිබඳ තොරතුරු ඇතුළත්ය.
5. සියළුම ලිපි ලියා ඇත්තේ සංස්කෘත භාෂාවෙනි. (.......)

23) ඉන්දු නිම්න වැසියාගේ සමාජ ජීවිතය
1. පීතෘ මූලික සමාජයක් ලෙස පැවතුනි.
2. ධනපති කම්කරු පන්ති භේදයක් දක්නට ලැබුණි.
3. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ආභරණ පැළඳීය.
4. නිරත වූ වෘත්තිය අනුව පන්ති භේදයක් දක්නට ලැබුණි.
5. දාදු, මල්ලව පොර ආදී ක්‍රීඩා ප්‍රචලිත විය. (.......)

24) සොලොස්මහා ජනපද වල පැවති රාජාණ්ඩු පාලනය

1. මගධ, කෝසල, වත්ස්‍ය, අවන්ති ප්‍රධාන රාජාණ්ඩු සතර විය.
2. රජු සැමවිටම ඒකාධිපතියෙකු ලෙස කටයුතු කළේය.
3. චතුරංගනී සේනාවන් රජු සතුව පැවතුනි.
4. බල ව්‍යාප්තියේ දී මත්ස්‍ය න්‍යාය ඇතුළු විවිධ දේශපාලන න්‍යාය පැවතුණි.
5. අවසානයේ මගධ රාජ්‍යය ප්‍රධානම රාජ්‍ය බවට පත්විය. (.......)

25) මගධයේ නැගීමට මුල් වූ සාධක

1. නම්‍යශීලී සමාජ පසුබිම
2. මැනවින් ආරක්ෂිත වූ අගනුවර
3. ස්වභාවික සම්පත් බහුල වීම
4. රජවරුන් අනුගමනය කළ විවාහ ප්‍රතිපත්ති
5. පංජාබ් තැනිතලාවේ සාරවත් බව නිසා කෘෂිකර්මාන්තය දියුණු වීම. (.......)

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C),** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. පහත උපදෙස් සම්පිණ්ඩනය අනුව නිවැරදි පිළිතුර තෝරා වරහන තුල ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදිය. | (B) සහ (C) පමණක් නිවැරදිය. | (C) සහ (D) පමණක් නිවැරදිය. | (A) සහ (C) පමණක් නිවැරදිය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදිය. |

26) මෙගස්තනීස් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ මින් කුමක් ද?

A. - මෙගස්තනීස් ඉන්දියාවේ චන්ද්‍රගුප්ත මෞර්ය රාජ්‍ය සභාවේ සිටි ග්‍රීක තානාපතිවරයායි.
B. - ඔහු විසින් නැචුරාලීස් හිස්ටෝරියා ග්‍රන්ථය රචනා කර ඇත.
C. - ඔහුගේ ග්‍රන්ථ වලින් මෞර්‍ය යුගය පිළිබඳ බොහෝ තොරතුරු ලබා ගත හැක.
D. - ඔහුගේ ග්‍රන්ථවල කාලිංග යුද්ධය පිළිබඳ තොරතුරු ඇතුළත් වී ඇත. (.......)

27) ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණවලට අදාළ නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ කුමක් ද?

A. - මක්‍රාන් දුර්ගය ඉන්දියාවට පිවිසීමට තිබූ පහසුම මාර්ගය විය.
B. - සප්තසින්දු තැනිතලාව සෑම විටම මහා රාජ්‍ය බිහි කළ තැනිතලා විය.
C. - ඛයිබර් දුර්ගය තරණය කළ විට පළමුව හමුවන්නේ සරුසාර සින්දු නදී නිම්නයයි.
D. - ඉන්දියාවේ වයඹ දිග ආරක්ෂකයා ලෙස සැලකෙන්නේ හින්දු කුෂ් කඳු පෙළයි. (.......)

28) ඉන්දියාවේ ආර්යයන්ගේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ කුමක් ද?

A. - ආරම්භයේ දී ආර්යයන් සප්ත සින්දු ප්‍රදේශයේ ජනාවාස විය.

B. - පසුව ඔවුන් ගංගා යමුනා නිම්නයට ව්‍යාප්ත විය.

C. - වෛදික යුගයේ මුල් අවධියේ ඔවුන් වින්ධ්‍යාව තරණය කොට දකුණු ඉන්දියාවේ පදිංචි විය.

D. - ඔවුන් ඉන්දියාවේ ව්‍යාප්ත වුනු මුල් අවධිය ආර්යාවර්තය ලෙස හැඳින්වේ.

(........)

29) මෞර්ය අධිරාජ්‍යයේ පිරිහීම හා බිඳ වැටීමට අදාළ නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය කුමක් ද?

A. - කාලිංග යුද්ධයෙන් ලද පරාජය

B. - අවසන් කාලයේදී දුර්වල පාලකයන් පහල වීම.

C. - අශෝක රජු විසින් ගෙන ගිය බ්‍රහ්මණ විරෝධී ප්‍රතිපත්තිය.

D. - වයඹ දිගින් පැමිණි හූණ ආක්‍රමණ

(........)

30) ජෛන ආගම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය

A. - දෙවියන් විශ්වාස කිරීම දක්නට ලැබුණි.

B. - ලෝකය දෙවියන් විසින් මවන ලද බව පිලිගැනුණි.

C. - ශරීරයට දැඩි දුක් දීමෙන් විමුක්තිය ලබා ගත හැකි බව ප්‍රකාශ කෙරෙණි.

D. - යාගය හා වෛදික චාරිත්‍ර නිරතුරුව සිදු කළ යුතු බව පිළිගත්තේය. (........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31) ආර්යාවර්තයේ දකුණු සීමාව ලෙස සලකනු ලැබූ කඳු වැටිය කුමක් ද?

1. වින්ද්‍යා
2. කිර්තාර්
3. හිමාලය
4. කාර්ඩමන්
5. බටහිර ඝාට්ස්

(........)

32) කාශ්මීරයේ වංශ කතාව ලෙස සලකන ලද ග්‍රන්ථය කුමක්ද?

1. මහාභාරතය
2. දශකුමාර චරිතය
3. රාජතරංගනී
4. විෂ්ණුපුරාණය
5. රාමායණය

(.......)

33) පාඨලීපුත්‍ර නගරය පළමුවරට අගනගරය බවට පත් කර ගත් මගධ පාලකයා කවරෙක්ද?

1. බිම්බිසාර
2. අජාසත්ත
3. සිසුනාග
4. පළවන චන්ද්‍රගුප්ත

34) පැරණි ධාන්‍යාගාරයක නටබුන් සොයා ගන්නා ලද ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් පැරණි නගරය කුමක්ද?

1. රූපාර්
2. ලෝතාල්
3. රාඛීසාර්හී
4. හරප්පා
5. මොහෙන්ජොදාරෝ

(........)

35) ග්‍රීක ජාතික මහා ඇලෙක්සැන්ඩර්ට සමකාලීන මගධ පාලකයා කවරෙක් ද?

1. මහා පද්මනන්ද
2. දනනන්ද
3. අශෝක
4. බිම්බිසාර
5. කාලාශෝක

(........)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැ' යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36) | භාරතයන්ගේ සටන පිළිබඳ තොරතුරු දැක්වෙන වෘත්තාන්තය රාමායනයයි. | මෙම සටන සිදු වූයේ නර්මදා නදිය ආසන්නයේ දීය. | (.............) |
| 37) | ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මැනවින් සැලසුම් කරන ලද මාර්ග පද්ධතියක් දක්නට ඇත. | එම මාර්ග ඉදි කර ඇත්තේ ගල් හා තාර යොදා ගනිමිනි. | (.............) |
| 38) | ඍග් වේදයට අනුව පුරන්දර දෙවියන් හරියුපියා නගරය විනාශ කලේය. | විද්වතුන්ට අනුව හරියුපියා නගරය යනු හරප්පා නගරයයි. | (.............) |
| 39) | ඇලෙක්සැන්ඩර්ගේ හමුදාව බියස් නදිය තෙක් සාර්ථකව ගමන් කළේය. | ඉන් ඔබ්බට බලය ව්‍යාප්ත කිරීම ඇලෙක්සැන්ඩර් විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ නන්දවරුන් සතුව පැවති හමුදා බලය හේතුවෙනි. | (.............) |
| 40) | මෞර්ය අධිරාජ්‍ය බිඳ වැටීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ හූණ ආක්‍රමණයයි. | අශෝක රජු මිය යන්නට මත්තෙන් මෞර්ය අධිරාජ්‍ය කොටස් කිහිපයකට බෙදී ගොස් පරිහානිය ආරම්භ විය. | (.............) |